(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 50.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **අනුර සිඩ්නි ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **ලකී ජයවර්ධන මහතා**

ගරු **මයිල්වාගනම් තිලකරාජා මහතා**

ගරු **ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 අංක 41 දරන විසර්ජන පනතේ 6 (1) වැනි වගන්තිය යටතේ 2015.12.31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම -2015, පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**2. පෙත්සම් :**

(1) අම්බලන්තොට, ගල්ලැලිතොට, රිදියගම පාර, අංක 336/6 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එස්. ආර්. ජී. මහින්ද මහතාගෙන් ලැබුණු 2015.12.06 දිනැති පෙත්සම ගරු දිලිප් වෙදආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මොරටුව, කල්දෙමුල්ල, සී. පී. ද සිල්වා මාවත, අංක 33 දරන ස්ථානයෙහි පදිංචි ලක්ෂ්මී කෝන්ගහවත්තගේ මහත්මියගෙන් ලැබුණු 2015.10.01 දිනැති පෙත්සම ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කඩුගන්නාව, ලගමුව, ගම්පල පාර, අංක 156 දරන ස්ථානයෙහි පදිංචි ඊ. අනුලාවතී මෙනවියගෙන් ලැබුණු 2015.10.25 දිනැති පෙත්සම ගරු ලකී ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(4) වීරකැටිය, හිඟුරාමුලන, බදුනුහෙයායවත්ත යන ලිපිනයෙහි පදිංචි සරත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2015.12.19 දිනැති පෙත්සම ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) මහවෙල, පල්දෙනිය යන ලිපිනයෙහි පදිංචි ආර්. ඒ. සරත් අසේල පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.11.01 දිනැති පෙත්සම; සහ

(ii) මාතලේ, කිවුල, උල්පතපිටිය, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි එස්. එල්. එම්. මහරූෆ් මහතාගෙන් ලැබුණු 2015.12.21 දිනැති පෙත්සම

ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) හක්මණ, කරතොට, අංක 176, "සඳසිරි" යන ලිපිනයෙහි පදිංචි ඩී. ඒ. බස්නායක මහතාගෙන් ලැබුණු 2015.12.22 දිනැති පෙත්සම;

(ii) ලුණුවිල, පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාත්මක හා තාක්ෂණික සේවා නිලධාරීන්ගේ සංගමයේ ලේකම් ඊ. එස්. ශාන්ත මහතාගෙන් ලැබුණු 2015.11.04 දිනැති පෙත්සම;

(iii) නිට්ටඹුව, රන්පොකුණුගම II අදියර, අංක එෆ්/226 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ආර්. එස්. රූපසිංහ මහතාගෙන් ලැබුණු 2015.12.01 දිනැති පෙත්සම;

(iv) මාතර, හිත්තැටිය මැද, කප්පල කුඹුර (ඕවිට) යන ලිපිනයෙහි පදිංචි ජානකී පල්ලියගුරු මහත්මියගෙන් ලැබුණු 2016.01.13 දිනැති පෙත්සම;

(v) අකුරැස්ස, පෝරතොට, පාළුවවත්ත යන ලිපිනයෙහි පදිංචි එල්. ඒ. ක්‍රිෂාන්ති මහත්මියගෙන් ලැබුණු 2016.01.12 දිනැති පෙත්සම;

(vi) මාතර, ඇලවෙල්ල පාර, සුජාතා උයන, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි එම්. සූරියආරච්චි මහත්මියගෙන් ලැබුණු 2015.11.23 දිනැති පෙත්සම;

(vii) මාතර, ඇලවෙල්ල පාර, සුජාතා උයන, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි එම්. සූරියආරච්චි මහත්මියගෙන් ලැබුණු 2015.11.23 දිනැති පෙත්සම;

(viii) කනංකේ කඩවීදිය, නිමලව, තෙපුදෙණිය, මැද්දගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි ආර්. ඒ. සදාසිවම් මහතාගෙන් ලැබුණු 2015.12.23 දිනැති පෙත්සම;

(ix) තෙලිජ්ජවිල, ඇල්ගිරිය, විකුම්පාය, අංක 80 දරන ස්ථානයෙහි පදිංචි ආර්. කේ. කේ. ඉෂාරා මධුෂානි මෙනවියගෙන් ලැබුණු 2016.01.12 දිනැති පෙත්සම; සහ

(x) මාතර, වෙහෙරහේන, විහාර මාවත, නාමල් පෙදෙස යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. සරත් මහතාගෙන් ලැබුණු 2015.12.09 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) කල්මුනේ, පන්සල පාර, ශ්‍රී සුභද්‍රාරාම මහ විහාරය බාරේ යන ලිපිනයෙහි පදිංචි එච්. ඩබ්ලිව්. ඒ. රණතුංග මහතාගෙන් ලැබුණු 2015.12.23 දිනැති පෙත්සම ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(8) (i) වැල්ලම්පිටිය, මෙගොඩ කොළොන්නාව පාර, අංක 2/1 දරන ස්ථානයෙහි පදිංචි බී. නිමල්වංශ පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.10.05 දිනැති පෙත්සම; සහ

(ii) කොළොන්නාව, කැප්පෙටිපොල මාවත, අංක 17/9 දරන ස්ථානයෙහි පදිංචි පී. ඒ. තිලකසිරි ද අල්විස් මහතාගෙන් ලැබුණු 2015.12.11 දිනැති පෙත්සම

ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු කේ. කාදර් මස්තාන් මහතා, ගරු තාරක බාලසූරිය මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජම් ඉය්යතුස් සහ්වා අල්-හයිරිය්යා (ජස්කා) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**4. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු කේ. කාදර් මස්තාන් මහතා, ගරු තාරක බාලසූරිය මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා සෙත්සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.

(අ. භා. 2.20 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

**5. පඩිපාලක සභා ආඥාපනත යටතේ නියෝගය :** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— (136 වැනි අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 63 වැනි වගන්තිය යටතේ, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.20 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.45 ට, 2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා අ. භා. 1.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.